**පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சு**
**MINISTRY OF PARLIAMENTARY REFORMS AND MASS MEDIA**

චක්‍රලේඛ අංක: ආර්ටීඅයි/01/2016 2016.10.

**සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්/පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**

**සහ දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත**

**<u>2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම</u>**

2016 අගෝස්තු මස 04 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සියළුම පොදු අධිකාරීන්ගේ වගකීමක් වේ. ඒ සම්බන්ධව මෙම අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් 2016.09.01 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී අමාත්‍යංශ ලේකම්වරුන් හා පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සඳහා විශේෂ වැඩමුළුවක්ද පවත්වන ලද අතර එහිදී ඊට අදාළ තීරණ වලටද එළඹුනි. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මූලික කාර්යයන් ආරම්භ කිරීම සඳහා ඔබ අමාත්‍යංශය යටතේ ඇති සියළුම රාජ්‍ය ආයතන දැනුවත් කර පහත පියවරයන් ක්‍රියාත්මක කිරීමට ඔවුන් වෙත අවශ්‍ය උපදෙස් නිකුත් කරන මෙන් කාරුණිකව දන්වමි.

**1. පනතේ 23 වගන්තිය ප්‍රකාර සෑම පොදු අධිකාරියක් විසින්ම "තොරතුරු නිලධාරියකු" පත් කිරීම**

ඔබ අමාත්‍යංශයට හා අමාත්‍යංශය යටතේ ඇති එක් එක් ආයතන සඳහා (පළාත් හා දිස්ත්‍රික් ආයතන ඇතුළුව) තොරතුරු නිලධාරියකු හෝ නිලධාරීන් එකකට වැඩි වැඩිගණනක් නම් කිරීමට කටයුතු සැලැස්විය යුතුය. මේ සඳහා එකී ආයතනයේ දෙවන මට්ටමේ විධායක නිලධාරියකු හෝ නිලධාරීන් එකකට වැඩි ගණනක් "තොරතුරු නිලධාරීන්" ලෙස තෝරා ගත යුතුය. එම පනතට අනුව "නම් කළ නිලධාරියා" වශයෙන් (designated officer ) ආයතන ප්‍රධානියා, අභියාචනා සම්බන්ධව කටයුතු කළ යුතු බැවින් දෙවන මට්ටමේ නිලධාරියා/නිලධාරියකු "තොරතුරු නිලධාරී" ලෙස නම් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව ඔබ අමාත්‍යංශයට අදාළ සියලුම ආයතන සඳහා මෙසේ නම් කළ "තොරතුරු නිලධාරීන්ගේ" විස්තර ඇමුණුම 1 අනුව සකස් කර 2016.10.31 වන දිනට ප්‍රථම මෙම අමාත්‍යංශය වෙත එවීම අත්‍යවශ්‍ය වේ.

**2. තොරතුරු/වාර්තා නියමිත ආකෘතියක් යටතේ සංරක්ෂණය කර පවත්වාගෙන යාම;**

I. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 7 (1) වගන්තිය ප්‍රකාර සෑම පොදු අධිකාරියක් විසින්ම තමන් සතු තොරතුරු/වාර්තා නිශ්චිත නාමාවලියක් හෝ සූචියක් අනුව සකස් කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

"ඇසිදිසි මැදුර", අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05. "எசிதிசி மெதுர", இல. 163, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொட, கொழும்பு 05.
"Asidisi Medura", No. 163, Kirulapone Mawatha, Polhengoda, Colombo 05, Sri Lanka.

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය / பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சர் / MINISTER OF PARLIAMENTARY REFORMS AND MASS MEDIA — Tel. : 011 2513507, Fax : 011 2514352

ලේකම් / செயலாளர் / SECRETARY — Tel. : 011 2513467, Fax : 011 2513458, e-mail : secretary@media.gov.lk, secmedia14@gmail.com

කාර්යාලය / அலுவலகம் / OFFICE — Tel. : 011 2513459 - 011 2513460, 011 2513498 - 011 2512321, 011 2512324

web site: www.media.gov.lk